


# විජය නන්දසිරිගෙන් පසු

**තරිඳු උඩුවරගෙදර**

බල්ලොත් එක්ක බෑ කියන්නේ මෑත කාලයේ වැඩියෙන්ම බැණුම් අහපු වැඩියෙන්ම බලපු නාට්‍යය....

ඒක සාර්ථක වෙන්න අන් සියල්ලට වඩා ප්‍රධාන හේතුව වුණේ අතිවිශිෂ්ඨ නළුවන් දෙන්නෙක්. ගිහාන් ප්‍රනාන්දු සහ විජය නන්දසිරි...

එතුමා, නෝනාවරුනි මහත්වරුනි, යර්ස් බොස් වගේ නිර්මාණ හරහා ටෙලිනාට්‍ය වල වෙනම මාක් එකක් ඔහු තිබ්බා.

අනෙක් අතට සිකුරු හතේ කියන්නෙත් ඒ වගේ චිත්‍රපටියක්.... ඒකෙන් විජය නන්දසිරිගෙන් චිත්‍රපටියක් ගොඩදාන්න පුළුවන් කියලා ඔප්පු වුණා.... හරහට වැටිලා කෙළින් නැගිටින බන්දුලාගේ දැනියෙල් මිගෙල් ජෝක් රහවිඳලම අපුල වෙලා හිටපු අය විජයගෙ ජෝක් බලන්න ගියා.... නිං හන්තර්, කෝ මාක් නෝ මාක්, සුහද කොකා, මගෝඩිගෝඩයි වගේ විජය නන්දසිරි තමන්ගේ සිනමා රැල්ලක් හදාගත්තා...

ඒත් අන්තිමට ඔහු කරලා තියෙන්නේ මොකක්ද? බඩ මහත පන්තියක් පීඩිත මිනිසුන්ව අමතක කරපු ලෝකයක විහිළු භාණ්ඩයක් බවට පත්වෙලා ඔහු හිටියා... ඔහු සටන් කළේ නැහැ.... භීෂණකාරී යුගයක ඔහු නිහඬවම හිටියා....

අතිවිශිෂ්ඨ අසමසම රංගන ශිල්පියා විජය නන්දසිරි පරමාදර්ශයක් නෙවෙයි...

ප්‍රියංකර රත්නායක එක්ක මෑත දවසක සෑහෙන සාකච්ඡාවක හිටියා. ඊට ටික දවසකට කලින් ගිහාන් ප්‍රනාන්දු එක්කත් කතා කළා. ඒ විතරක් නෙවෙයි සරත් කොතලාවල එක්කත් දිග ඉන්ටර්විව් එකකදී කතා කරන්න ලැබුණා.

මේ අය එක්ක කතා කරද්දී මං ඇහුව දෙයක් තමයි මෑත කාලයේ විශිෂ්ඨ නළුවෝ සෑහෙන පිරිසකට විකට ටෙලිනාට්‍ය, විකට නාට්‍ය සහ විකට චිත්‍රපටි ඇතුළේ හිරවෙන්න වෙලා තිබුණු හිරවීම. ඒවා කරන්න ඔවුන්ට සිද්ධවෙලා තිබුණේ එදිනෙදා යමක් හොයාගන්නට. සම්භාව්‍ය නිර්මාණ ඒ දක්ෂයන්ට නොලැබුණා විතරක් නෙවෙයි ඉඳහිට හැදෙන එවන් නිර්මාණ වලින් එදිනෙදා ජීවත්වෙන්නවත් ඔවුන්ට ආදායමක් ලැබුණේ නැහැ.

ඒ කතාවේදී මේ හැමෝම කතාකළා විජය නන්දසිරි ගැන. ඔහු වගේ ප්‍රතිභාපූර්ණයෙක්ට විකට නාට්‍ය වල හිරවෙන්න වීම ගැන.

දැන් විජය නන්දසිරිම මිය ගිහින්....

මේ හදිසියේ ඔහු ගැන මොනවා ලියන්නද? හෙට අනිද්දා වෙද්දී ඔහු ගැන පත්තර පිටු ගණන් ලියැවේවි. ටීවී එකේ වාර්තා වැඩසටහන් කරාවි.



හෙට ගිහාන් ප්‍රනාන්දු, කුමාර තිරිමාදුර, සරත් කොතලාවල, ගිරිරාජ් කෞශල්‍ය වගේ නළුවන්ටත් උරුම මේ වගේ අනාගතයක්ද?

මනමේ කුමාරයා සිය ජීවිතය සුහද කොකා ලෙස අවසන් කළා....

මෙය කලාවේ බේදවාචකයක ප්‍රතිඵලයක් කියලා කියන්න පුළුවන්....

ඒකේ තවත් කෑල්ලක් තියෙනවා... (සමාවෙන්න විජය නන්දසිරි)

ඔහු රංගනයේ අතිවිශිෂ්ඨ බව ඇත්තයි... එහෙත් වෙනසක් වෙනුවෙන් පෙනී සිටින්නට ඔහු සටන් කළ ප්‍රමාණය තවත් මදි... විජය නන්දසිරිලාත් කලාවේ ඛේදවාචකයේ ගොදුරු බවට පත්වුණා මිස ඔවුන් ඒකට විරුද්ධව සටන් කරන්නට පෙළඹුනා මදි කියලයි හිතෙන්නේ....

වෙනස කිව්වේ මහින්ද මෛත්‍රී ආණ්ඩු මාරුව වගේ හිංචි පිංචි වැඩ නෙවෙයි... ඒවාට සම්බන්ධ වීම හෝ නොවීම එයාගේ පෞද්ගලික කාර්යයක්.... (දැන් වෙනස කිව්වාම ඒ බයිලාවම තමයි මතක් වෙන්නේ)

දෙස් විදෙස් ප්‍රේක්ෂක ආදරය සහ ගෞරවයත්, නොයෙක් ස්ථානවලදී ලැබූ සම්මාන සහතිකත් හැරුණු කොට වෘත්තීය මට්ටමේ කලාකරුවකු වන මට කිසිදු රජයකින් ලැබුණු විශේෂිත වූ කිසිවක් නැහැ. අත පය හයිය තියෙන කම් මේ සෙල්ලම් පෙන්විය හැකි වුවත් වයසට යමින් පවතින මා වැනි බොහෝ කලාකරුවන්ට අද කිසිදු හවිහරණක් නැති බව සිහිපත් කළ යුතුයි. අපේ රටේ කලාකරුවන්ගේ අනාගතය ඇත්තටම හරිම ශෝචනීයයි. අපට පැන්ෂන් එකක්වත් නැහැ. ඒ වෙනුවෙන් සාධාරණයක් ඉටු කිරීමට කිසිදු රජයක් මැදිහත් වුණු බවක් පෙනෙන්නටවත් නැහැ.

මේ දිවයිනට ඔහු කී කතාවක්.....

මේ දිනවල මම වේදිකා නාට්‍යය කීපයකටම සම්බන්ධ වෙලා ඉන්නවා. මල්වඩම් අනවශ්‍යයි, බල්ලොත් එක්ක බෑ නාට්‍ය එක්ක මම රට වටේම යනවා. සමහරු අහනවා ඇයි අලුතින් වේදිකා නාට්‍යයක් කරන්නේ නැත්තේ කියලා. 2016 අවසන් වෙනකල් එක සති අන්තයක්වත් හොයා ගන්න නෑ මට. දින වෙන් කරගෙන තියෙන්නේ නාට්‍යය සඳහා.

ප.ලි. * මං උඩින් කී කතා ඔහුට අසාධාරණයක් අගරුවක් වෙන්න පුළුවන්... ඒත් පරමාදර්ශවත් දැවැන්ත චරිතවත් රැකගෙන මොනවා කරන්නද? මං නොදන්නා සටනක් විජය නන්දසිරි කරලා තියෙනවා වෙන්න පුළුවන්... අවසාන වශයෙන් ඔහුව මං ඇතිවෙන්න රසවිඳලා තියෙනවා... ඔහු විප්ලව කරන්නවත් වෙනස්කං කරන්න ඕනෙවත් කියලා නීතියක් නැහැ... ඔහු කාටවත් ණය නැහැ... ඔහු විශාල කැපකිරීම් එක්ක මහන්සි වෙලා වැඩ කරපු කලාකාරයෙක්...

https://uduwaage.blogspot.com.au/2016/08/blog-post_8.html

